සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# මධ්‍ය වාර පරීක්ෂණය 2015

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

**10 ශ්‍රේණිය** **කාලය පැය 03 යි.**

නම/ විභාග අංකය:

## I - කොටස

- අංක 01 සිට 20 තෙක් වූ ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

01 ග්‍රාහකයා යනු,

(1) පණිවිඩය ඉදිරිපත් කරනු ලබන්නා ය.

(2) මාධ්‍යය සඳහා සංදේශය සකස් කරන්නා ය.

(3) සන්නිවේදන ක්‍රියාවලියේ ආරම්භකයා ය.

(4) පණිවුඩය ලබාගන්නා පුද්ගලයා ය.

02 පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියේ පළමු පියවර වන්නේ,

(1) යතුරු ලියනය කිරීමයි. (2) අත්පිටපත සැකසීමයි.

(3) සෝදුපත් බැලීමයි. (4) අක්ෂර යෝජනය කිරීමයි.

03 ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය හිමිකාරීත්වය පිළිබඳ ප්‍රධාන වර්ගීකරණය වන්නේ,

(1) සමාගම් මාධ්‍ය හා පවුල් මාධ්‍යයයි.

(2) රාජ්‍ය මාධ්‍ය හා මහජන සේවා මාධ්‍යයයි.

(3) රාජ්‍ය මාධ්‍ය හා පෞද්ගලික මාධ්‍යයයි.

(4) වාණිජ මාධ්‍ය හා රාජ්‍ය මාධ්‍යයයි.

04 පුද්ගලයෙකුගේ සිත තුළ හටගන්නා අදහස්, සිතුවිලි ආදිය සංකේත ඇසුරින් පණිවිඩ බවට පරිවර්තනය කිරීම

(1) ආකේතකරණයයි. (2) විකේතකරණයයි.

(3) කේතකරණයයි. (4) ආත්මභාෂණයයි.

05 ෆැක්ස් යන්ත්‍රය යොදාගත හැකි සන්නිවේදන ප්‍රභේදය වන්නේ,

(1) පුද්ගලාන්තර සන්නිවේදනයයි. (2) ජන සන්නිවේදනයයි.

(3) අන්තර්වර්තී සන්නිවේදනයයි. (4) විශ්ව සන්නිවේදනයයි.

06 සුදත්ට තම සහතික පත්‍ර දිගුකලක් සුරක්ෂිතව තබාගැනීමට අවශ්‍යය විය. ඒ සඳහා භාවිතා කළ හැකි වඩාත් යෝග්‍ය ක්‍රමවේදය වන්නේ,

(1) සහතිකවල ඡායාපිටපත් කිහිපයක් ලබාගැනීමයි.

(2) කඩදාසි ලිපි කවරයක බහා සීල් තැබීමය.

(3) පොලිතීන් ආවරණයක් යොදා ලැමිනේට් කිරීමයි.

(4) ඩිජිටල් කැමරාවකින් ඡායාරූපගත කිරීමයි.

07 මේවායින් අවිධිමත් සන්නිවේදන අවස්ථා වන්නේ,

(1) කටකතා, කේලාම් හා ඕපාදූප ය.

(2) පත්තර, කටකතා හා නිර්නාමික ලිපිය.

(3) කැළෑ පත්තර, සංගීත සංදර්ශන හා ඕපාදූප ය.

(4) උද්ඝෝෂණ, ලිපි හා කේලාම් ය.

08 රූපයෙන් දැක්වෙන්නේ,



(1) ඩුප්ලෝ යන්ත්‍රයකි.

(2) රෝනියෝ යන්ත්‍රයකි.

(3) තැපැල් මුද්‍රා යන්ත්‍රයකි.

(4) ඡායා පිටපත් යන්ත්‍රයකි.

09 සන්නිවේදනය පිළිබඳ ගණිතමය ආකෘතිය හඳුන්වා දෙන ලද්දේ,

(1) විල්බර් ශ්‍රාම් විසිනි. (2) ඩේවිඩ් කේ. බර්ලෝ විසිනි.

(3) ඔස්ගුඩ් හා ශ්‍රාම් විසිනි. (4) ෂැනොන් හා වීවර් විසිනි.

10 ජනමාධ්‍යය මගින් ඉදිරිපත් කරන වෙළඳ දැන්වීම්

(1) වෙළඳ ආයතනවල අරමුණු ඉටුකිරීමට සමත් විය යුතුය.

(2) ග්‍රාහකයාට උපරිම විනෝදාස්වාදයක් සැපයිය යුතුය.

(3) සමාජ සදාචාරයට හා සාරධර්මවලට හානි නොකළ යුතුය.

(4) එම භාණ්ඩ මිලදී ගැනීමට ජනතාව පෙළඹවිය යුතුය.

11 ගුවන් විදුලිය ශ්‍රව්‍ය මාධ්‍යයකි. එබැවින් හොඳ ගුවන් විදුලි නාලිකාවක් සෑම විටකදීම

(1) කිවයුතු සියලු දේ කථනය හා ශබ්ද මගින් ඉදිරිපත් කරයි.

(2) සාක්ෂරතාව රහිත ශ්‍රාවකයාට ගෝචර නොවේ.

(3) හැකි තරම් චතුර හා වේගයෙන් කතා කරන අයට අවස්ථාව සලසයි.

(4) නිරන්තරයෙන්ම ගීත ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව සලසයි.

12 භාෂා නිපුණතාව හා පරිකල්පන ශක්තිය වඩාත් අවශ්‍යය වන මාධ්‍ය වනුයේ,

(1) ගුවන් විදුලිය හා රූපවාහිනියයි. (2) පුවත්පත හා සිනමාවයි.

(3) පුවත්පත හා ගුවන් විදුලියයි. (4) රූපවාහිනිය හා පුවත්පතයි.

13 අක්ෂි සම්බන්ධතාව යනුවෙන් හඳුන්වනු ලබන්නේ,

(1) රූපවාහිනිය නැරඹීමේ දී ඒ දෙසම බලා සිටීමයි.

(2) කෙනෙක් සමග කථා කිරීමේ දී ඒ පුද්ගලයා දෙස ඇස් යොමු කිරීමයි.

(3) පොතක් කියවීමේ දී සිදුවන අක්ෂිවල ක්‍රියාකාරීත්වයයි.

(4) සමූහ සන්නිවේදනයේ දී වරින් වර සමූහය දෙස බැලීමයි.

14 පුද්ගලාන්තර සන්නිවේදනයේ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A අඛණ්ඩ හා ගතික ක්‍රියාවලියකි. B වෙනස්කළ නොහැකි ක්‍රියාවලියකි.

C නැවත නැවතත් සිදුකළ හැකි ක්‍රියාවලියකි.

ඉහත ලක්ෂණවලින් වඩාත් ගැලපෙනුයේ,

(1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය. (4) A, B හා C ය.

15 ජනමාධ්‍ය ආයතනයක ප්‍රතිපත්ති සකස් කරනු ලබන්නේ,

(1) ග්‍රාහකයින්ය (2) ජනමාධ්‍යවේදීන් ය

(3) දැන්වීම්කරුවන්ය (4) හිමිකරුවන්ය

16 ඩී. ආර්. විජේවර්ධන, ඇම්. ඩී. ගුණසේන සහ උපාලි විජේවර්ධන යන චරිත හඳුනාගන්නේ,

(1) ශ්‍රී ලංකාවේ ප්‍රවෘත්ති සංස්කාරකවරුන් ලෙසය.

(2) ශ්‍රී ලංකාවේ රූපවාහිනිය හඳුන්වා දුන් පුද්ගලයින් ලෙසය.

(3) ශ්‍රී ලංකාවේ පුවත්පත් කර්මාන්තයේ ප්‍රබල චරිත ලෙසය.

(4) ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි සංස්ථාවේ ප්‍රබල චරිත ලෙසය.

17 පේජරය වර්තමානයේ දී භාවිතයෙන් ගිලිහී යමින් පවතින තොරතුරු හුවමාරු උපකරණයකි. එසේ වීමට බලපාන ප්‍රධාන හේතුවක් වන්නේ,

(1) එය මිල අධික වීමයි. (2) ජංගම දුරකථනයේ ව්‍යාප්තියයි.

(3) අන්තර්ජාලයේ ව්‍යාප්තියයි. (4) භාවිතයේ ඇති අපහසුවයි.

18 එක් අයෙකු කේන්ද්‍රකරගෙන බොහෝ දෙනෙකුට තොරතුරු පැතිරී යන විධිමත් සන්නිවේදන ආකෘතිය

(1) චක්‍රීය ආකෘතියයි. (2) දාම ආකෘතියයි.

(3) වයි ආකෘතියයි. (4) රෝද ආකෘතියයි.

19 විනිවිදක ප්‍රක්ෂේපන යන්ත්‍රය වඩාත් උචිත වන්නේ,

(1) සංඛ්‍යා හා රූපාශ්‍රිත දත්ත වැඩිපුර ඇතිවිටය.

(2) පෙළ, රූප සහ සංඛ්‍යා ආශ්‍රිත දත්ත වැඩිපුර ඇති විටය.

(3) රූප හා සිතියම් ආශ්‍රිත දත්ත වැඩිපුර ඇති විටය.

(4) චලන හා රූප සටහන් වැඩිපුර ඇති විටය.

20 ගස්වල එල්ලූ කොළ අතු, චිත්‍ර, දූම ආදිය අයත් වන්නේ,

(1) සාම්ප්‍රදායික දෘශ්‍ය මාධ්‍යයටය. (2) නිර්වාචික සන්නිවේදනයටය.

(3) දෘශ්‍ය මාධ්‍යයටය. (4) ආවාචික සන්නිවේදනයටය.

## II - කොටස

- **පළමුවන ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

01 එක්තරා වෙළඳ සමාගමක මෙතෙක් මිනිස් ශ්‍රමය යොදා සිදුකරන ලද සියලු කටයුතු පරිගණකය හා අනෙකුත් යන්ත්‍ර උපකරණ ආශ්‍රයෙන් සිදුකිරීමට කළමනාකරණ අධ්‍යක්ෂවරයා තීරණය කර ඇත. එදින උත්සවාකාරයෙන් කාර්යාලීය වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

(1) කළමනාකරණ අධ්‍යක්ෂවරයා ගත් තීරණය කුමන සන්නිවේදන වර්ගයකට අයත් ද?

(2) උත්සවාකාරයෙන් කාර්යාලීය වැඩකටයුතු ආරම්භ කිරීම සනිටුහන් කරන නිර්වාචික සන්නිවේදන විධික්‍රම 2 ක් ලියන්න.

(3) අධ්‍යක්ෂවරයා සේවකයින් අමතා උපකරණ හඳුන්වාදීමේ කතාවක් පැවැත්වූයේ නම් එයට අදාළ සන්නිවේදන ස්වරූපය කුමක් ද?

(4) ලිපියක විශ්වාසනීයත්වය හා නීත්‍යානුකූල බව තහවුරු කිරීමට භාවිතා කළ හැකි උපකරණය කුමක් ද?

(5) කාර්යාලයට හඳුන්වාදුන් මුදල් ගනුදෙනුවක සටහන යාන්ත්‍රිකව මුද්‍රණය කළ හැකි උපකරණය කුමක් ද?

(6) මෙම කාර්යාලයෙන් දිනපතා විශාල ලිපි ප්‍රමාණයක් තැපැල් කරන්නේ නම් ඒ සඳහා භාවිතා කළ හැකි ආරක්ෂිත මුදල් අයකිරීමට භාවිතා කරන උපකරණය කුමක් ද?

(7) ඔබ වෙත ලැබෙන දුරකථන ඇමතුමක් කවර දුරකථන අංකය සහිත දුරකථනයක් භාවිතා කර ලබා ගත්තේ ද යන්න දැන ගැනීමට ඔබගේ දුරකථනයේ තිබිය යුතු පහසුකම කුමක් ද?

(8) පරිගණකය භාවිතයත් සමග යල්පැන යමින් ඇති කාර්යාලීය මාධ්‍ය උපකරණය කුමක් ද?

(9) අධ්‍යක්ෂවරයාට විදේශීය තානාපති කාර්යාලයට ලිපියක් කඩිනමින් යැවිය යුතුව ඇත. මේ සඳහා වඩාත් උචිත ක්‍රමවේදය කුමක් ද?

(10) පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලිය නිසා කාර්යාලයට අත්විඳිය හැකි වාසි 2 ක් ලියන්න.
(2 x 10 = 20)

02 (1) ලැස්වෙල් හඳුන්වාදුන් සන්නිවේදන මූලිකාංග 4 ක් ලියන්න. (ල. 02)

(2) සන්නිවේදනය පිළිබඳ ගණිතමය සූත්‍රයේ දක්වෙන බාධා වර්ග නම්කර පැහැදිලි කරන්න. (ල. 04)

(3) ද්විමාර්ගික සන්නිවේදන සූත්‍රය ඇඳ සන්නිවේදන ක්‍රියාවලිය සාර්ථක වීමට ග්‍රාහයයෙකුගේ කාර්යභාරය කරුණු 2 කින් පැහැදිලි කරන්න. (ල. 04)

03 (1) සංජානනය යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද? (ල. 02)

(2) ග්‍රාහකයාගේ සංජානනයට බාධා පැමිණෙන හේතු 4 ක් ඇත. ඒවා නම් කරන්න. (ල. 04)

(3) ජනසන්නිවේදන ක්‍රියාවලියේ දී බහුලව දක්නට ලැබෙන දොරටුපාල සංකල්පය පැහැදිලි කරන්න. (ල. 04)

04 (1) සමූහ සන්නිවේදනය අසාර්ථකවීමට බලපාන හේතු 4 ක් ලියන්න. (ල. 02)

(2) පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියේ මුල් පියවර 4 අනුපිළිවෙලින් පෙලගස්වන්න.(ල. 04)

(3) සාමාන්‍ය තැපෑලට සාපේක්ෂව විද්‍යුත් තැපෑලෙන් ඔබට හිමිවන වාසි 4 ක් ලියා ඒවායින් 1 ක් පැහැදිලි කරන්න. (ල. 04)

05 (1) රටක සිටින සියලු මාධ්‍යවේදීන් හෝ මාධ්‍යකරුවන් ප්‍රධාන වර්ග 2 කි. ඔවුන් නම් කරන්න. (ල. 02)

(2) අන්තර් ක්‍රියාකාරී පුවරුව යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න. (ල. 04)

(3) පිටු පෙරළනය පන්ති කාමරයේ සාර්ථකව භාවිතා කළ හැකි උපකරණයකි. මෙම ප්‍රකාශය සනාථ කළ හැකි කරුණු 4 ක් දක්වා ඒවායින් 1 ක් පැහැදිලි කරන්න. (ල. 04)

The National e-learning Portal for The General Education